Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

# ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

**උපදෙස්:-**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. මහසෙන් රජතුමා විසින් ඉදිකරවන ලද ''මින්නේරිය වැව'' මහාවංසයේ හඳුන්වා ඇති නාමය කුමක් ද?
   i. මනිමේඛලා  ii. මණිහිර  iii. මහකනදරා  iv. මයෙත්

2. විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණයක් **නොවන්නේ,**
   i. විශාල ජල ප්‍රමාණයක් ගබඩා කර ගත හැකි වීම යි.
   ii. ඇළ මාර්ග මගින් කුඩා ජලාශවලට ජලය ලබාගත හැකි වීම යි.
   iii. ගංවතුර පාලනය කරගත හැකි වීම යි.
   iv. වාරිමාර්ග ක්‍රමය පිරිහී යාම යි.

3. පහත උද්‍යාන නිර්මාණ අතරින් **මුටසිව** රජතුමාගේ අනුග්‍රහයෙන් ඉදිවූයේ,
   i. මහා මේඝවනය යි.  ii. නන්දන උයන යි.  iii. ජෝතිය වනය යි.  iv. පද්මස්වර උයන යි.

4. සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කර එහි බලය අල්ලාගත් පසු මන්නාරමට පලාගොස් පෘතුගීසින්ගේ රැකවරණය පැතූ **උඩරට පාලකයා** කවුරුන් ද?
   i. දොන් ජුවන් ධර්මපාල  ii. පළමු වන විමලධර්මසූරිය
   iii. කරලියද්දේ බණ්ඩාර  iv. ජයවීර බණ්ඩාර

5. මහනුවර රාජධානි සමයේ දී **යකඩ** කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියට පත් වූ **ප්‍රදේශය** කුමක් ද?
   i. දුම්බර  ii. පිළිමතලාව  iii. ගම්පොළ  iv. කොත්මලේ

- **අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

6. ගම්පොළ යුගයේ ඉදිවූ ඇම්බැක්කේ දේවාලය **ගල්** කැටයම් සඳහා ප්‍රසිද්ධය. ( )
7. දෙවන රාජසිංහ රජු **ගන්නෝරුව** ප්‍රදේශයේ දී **සටනකින්** පෘතුගීසින් පරාජයට පත්කරන ලදි. ( )
8. රජරට සමයට අයත් විශිෂ්ටතම වාහල්කඩ නිර්මාණය රුවන්වැලි සෑයේ **නැගෙනහිර දිශාවෙන්** හමුවේ. ( )
9. යුධගනාව දාගැබ පොළොන්නරු යුගයේ දී ඉදිවූවකි. ( )
10. ගන්ධ කුටි සම්ප්‍රදායට අනුව ඉදිවූ පිළිමගෙයක් **තොලුවිල** ප්‍රදේශයේ පිහිටා ඇත. ( )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 -15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

11. උඩරට ........................................................................ රජු වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනමන ලදි.
12. ෆ්ලෝරන්ස් නගරයේ සිටි ........................................................................ පවුල පුනරුද සමයේ කලාත්මක කටයුතු සඳහා අනුග්‍රහය ලබාදෙන ලදි.
13. ධාතුසේන රජතුමා විසින් කලාවැවේ සිට ........................................................................ වැවට ජලය ගෙන යාම සඳහා යෝධ ඇළ ඉදිකරවන ලද බව මූලාශ්‍රයවල සඳහන් වේ.
14. සෙනරත් රජුගෙන් පසුව ........................................................................ කුමරු දෙවන රාජසිංහ නමින් උඩරට සිහසුනට පත්විය.
15. වෙනත් ජල මූලාශ්‍රයකින් වැවට ලැබෙන ජලය, වැවට ඇතුල් කරගැනීම ........................................................................ මගින් සිදු කෙරේ.

(මෙඩිසි / පිටවාන / කීර්ති ශ්‍රී රාජසිංහ / ඩේවිඩ් / ඇතුළුවාන / නුවර / ටිකිරි / තිසා / මහා අස්ථාන / විජය රාජසිංහ)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16. ගම්වල නායකයින්ගේ මෙහෙයවීමෙන් ඉදිකරන ලද කුඩා වැව් ........................................................................ ලෙස හැඳින්වේ.
17. පොළොන්නරු රාජධානි සමය අවසානයේ එල්ල වූ ........................................................................ ආක්‍රමණයත් සමඟ රජරට ශිෂ්ටාචාරය බිඳ වැටුණි.
18. කුඩා දාගැබක් වටා ගල් කණු සිටුවා ඒ මත වහළයක් ඉදිකර සකස්කරන ලද වටකුරු ගොඩනැගිලි විශේෂය ........................................................................ නමින් හැඳින්වේ.
19. උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම අතර, මනාලියගේ නිවසේ මනාලයා පදිංචිවීම ........................................................................ විවාහය ලෙස හැඳින් වේ.
20. ඉංග්‍රීසීන් හට 1815 වසරේ දී උඩරට රාජධානියේ බලය අල්ලාගැනීම සඳහා උඩරට මහාඅධිකාරම්වරයකු වූ ........................................................................ නිලමේතුමාගේ සහයෝගය හිමි විය.

(ලකුණු 2**x**20=40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**



**1.**(අ) i. **A** ඡායාරූපයෙන් දැක්වෙන **පාලකයා** කවුරුන්දැයි නම් කරන්න.

ii. ඔහු රජ වීමට පෙර හැඳින් වූ **නම** කුමක් ද?

iii. ඔහු සිහසුනට පත් කිරීම සඳහා උපකාර කළ **මහාධිකාරම්වරයා** කවුද?

iv. ඔහු විසින් මහනුවර දළදා මාළිගාවට එක්කළ **චිත්තාකර්ශනීය** අංගය කුමක් ද? (ලකුණු 04 යි)




(ආ) i. **B** ඡායාරූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල හඳුන්වන නම ලියන්න.

ii. එය ඉදිකරවන ලද්දේ කුමන **රාජධානි සමයකදී** ද?

iii. එය ඉදිකරවූ **පාලකයා** නම් කරන්න.

iii. එතුමා විසින් සාදවන ලද ප්‍රසිද්ධ **වැවක්** නම් කරන්න. (ලකුණු 04 යි)



(ඇ) i. **C** ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන **නම් කරන්න.**

ii. පුනරුද සමයේ දී ඔහු ආකාශවස්තු නිරීක්ෂණය සඳහා නිපද වූ **උපකරණය** කුමක් ද?

iii. එම උපකරණය උපයෝගි කරගෙන ඔහු නිරීක්ෂණය කරන ලද ග්‍රහ වස්තු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)



(ඈ) i. **D** ඡායාරූපයෙන් දැක්වෙන **නිර්මාණය** හඳුනාගෙන නම් කරන්න.

ii. එය නිර්මාණය කරනු ලැබූයේ **කවුරුන් විසින්ද?**

iii. මෙම නිර්මාණය සිදු කිරීමට යොදාගෙන ඇති **පාෂාණ වර්ගය** කුමක් ද?

iii. මෙම නිර්මාණ ශිල්පියා විසින් සිස්ටයින් දෙව් මැදුරේ අඳින ලද ප්‍රසිද්ධ **චිත්‍රයක්** නම් කරන්න. (ලකුණු 04 යි)

**2.** i. පණ්ඩුකාභය රජතුමා විසින් ඉදි කරවන ලද වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. පහත සඳහන් වැව් ඒවා ඉදිකරවන ලද පාලකයන් අනුව **වර්ග කර** වගුවේ ලියන්න.

(මහා දත්තවාපී / මානන්කට්ටිය / ජල්ලූර වාපී /ඛානු වාපී / පාදුලක වාපී)

| **A** මහසෙන් රජතුමා | **B** ධාතුසේන රජතුමා |
|---|---|
| 1. ..................................... <br> 2. ..................................... | 3. ......................................... <br> 4. ......................................... |

(ලකුණු 04 යි)

iii. වැවක පහත අංගයන්ගෙන් ඉටුවන **කාර්යය** බැගින් ලියන්න.

**A** - වැව් බැම්ම     **C** - රළපනාව

**B** - සොරොව්ව     **D** - බිසෝ කොටුව

(ලකුණු 04 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**3.** i. පොළොන්නරුවේ පිහිටි ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ඉදිකරන ලද පිළිමගෙවල් **තුනක්** නම් කරන්න.
(ලකුණු 03 යි)

ii. අනුරාධපුර හා පොළොන්නරු යුගවලදී නිර්මාණය කරන ලද ප්‍රතිමාවන් ඇසුරින් පහත ප්‍රතිමා සඳහා **උදාහරණය බැගින්** ලියන්න.

**A** - හිටි බුදු පිළිමය **C** - ඉඳි පිළිමය

**B** - සැතපෙන පිළිමය **D** - බෝසත් ප්‍රතිමාව (ලකුණු 04 යි)

iii. (a) අතීත ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)

(b) පැරණි සෙල්ලිපිවල

1. තඹ කර්මාන්තයේ නිරතව සිටි පුද්ගලයන් හැඳින්වූ **නම** කුමක් ද?

2. බෙලෙක් කර්මාන්තයේ නිරතව සිටි පුද්ගලයන් හැඳින්වූ **නම** කුමක් ද? (ලකුණු 02 යි)

**4.** i. උඩරට රජවරුන් හා පෘතුගීසින් අතර ඇතිවූ සටන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. පළමුවන විමලධර්මසූරිය රජුට පෙර උඩරට රාජධානිය පාලනය කළ රජවරුන් **හතර දෙනෙකු** නම් කරන්න.
(ලකුණු 04 යි)

iii. පළමුවන විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ ආගමික සේවාවන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

**5.** i. පහත පුද්ගලයින්ගේ **බෞතීස්ම** නාමයන් ලියන්න.

**A** - යමසිංහ බණ්ඩාර

**B** - කුසුමාසන දේවිය

**C** - කොනප්පු බණ්ඩාර (ලකුණු 03 යි)

ii. උඩරට බලයට පත් නායක්කාර වංශික පාලකයන් **හතර දෙනා** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. මහනුවර රාජධානියේ සමාජ ක්‍රමය තුළ දැකිය හැකි ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

**6.** i. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

ii. a) - පුනරුදයට පෙර අවධියේ කලා ශිල්පවල දැකිය හැකි ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

b) - පුනරුද සමයේ බිහි වූ ගත්කතුවරුන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. පහත ප්‍රශ්න වලට පිළිතුරු **A. B, C** හා **D අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

**A** - මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?

**B** - ''අන්තිම රාත්‍රී භෝජනය'' නම් සිතුවම නිර්මාණය කළේ කවුරුන් ද?

**C** - පෘතුවිය හා අනෙකුත් ග්‍රහවස්තු සූර්යා වටා ගමන්කරන බව ප්‍රකාශ කළේ කවුරුන් ද?


**D** - පුනරුද සමයේ දී පල්ලියේ බලයට එරෙහිව නැගී සිටි කණ්ඩායම හැඳින් වූ නම කුමක්ද?

(ලකුණු 04 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**7.** i. (a) ඡායාරූපයේ දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.

(b) මෙහි එක් පෙළට සත්ත්ව රූප හතරක් කැටයම් කර ඇත. ඉන් සතුන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)




ii. උපකාරක පද යොදාගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

**හරහට**

1. පොළොන්නරුවේ ශිව දේවාලය ඉදිකර ඇත්තේ මෙම ගෘහ නිර්මාණ ශිල්පයට අනුවය.
2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසවගේ නම.
3. වල් බිහිව තිබූ සීගිරිය නැවත ලොවට හෙළිකර දුන් ලාංකික පුරාවිද්‍යාඥයෙකි.
4. පරාක්‍රම සමුද්‍රය අසල ඇති මෙම ප්‍රතිමාව මෙම ඍෂිවරයාගේ බව ඇතැම් අය විශ්වාස කරයි. (ලකුණු 04 යි)

**පහලට**

1. වසභ රජු විසින් කරවන ලද ඇළ මාර්ගයකි.
2. සීගිරියට ආසන්නයේ පිහිටි ලෙන් විහාරයකි.
3. පොළොන්නරුවේ දී දැකගත හැකි පොකුණකි.
4. පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරය පැවති අවධිය. (ලකුණු 04 යි)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

# ඉතිහාසය

පිළිතුරු පත්‍රය

## I කොටස

01. 2
02. 4
03. 1
04. 3
05. 4
06. ( ✗ )
07. ( ✓ )
08. ( ✗ )
09. ( ✓ )
10. ( ✓ )
11. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
12. මෙඩිසි
13. තිසා
14. මහාඅස්ථාන
15. ඇතුල්වාන
16. ගම්
17. කාලිංග මාඝ
18. වටදාගෙය / චෛතිය ඝර
19. බින්න
20. ඇහැලේපොළ

## II කොටස

**1.**

(අ) i. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
ii. කන්නසාමි
iii. පිළිමතලාවේ
iv. පත්තිරිප්පුව

(ආ) i. වෛජයන්ත ප්‍රාසාදය
ii. පොලොන්නරුව
iii. මහා පරාක්‍රමබාහු / පළමුවන පරාක්‍රමබාහු
iv. පරාක්‍රම සමුද්‍රය / පඩා වැව

(ඇ) i. ගැලීලියෝ ගැලිලි
ii. දුරදක්නය
iii. හිරු, බ්‍රහස්පති, සඳු

(ඈ) i. පියේටා / සිල්වත් බවේ මූර්තිය
ii. මයිකල් ආංජලෝ
iii. කිරිගරුඬ
iv. අවසන් විනිශ්චය / ආදම් හා ඒවා

**2.** i. ගාමිණි වැව, ජයවැව, අභය වැව (බසවක්කුළම)

ii. A මහසෙසන් - ජල්ලුරවාපි, ඛානු වාපි
B ධාතුසේන - මහාදත්ත වාපී, පාඳුලක වාපි

iii. A- වැවෙහි ජලය රඳවා තබා ගැනීම
B- වැවෙහි ජලය ප්‍රයෝජනය සඳහා පිටතට ගැනීම
C- වැව් බැම්ම සේදීයාම වැළැක්වීම
D- මනා පාලනයකින් යුක්තව ජලය පිටකිරීමට සොරොව්වට උපකාරී විම.

**3.** i. ථූපාරාමය, තිවංක පිළිමගෙය, ලංකාතිලකය

ii. A- අවුකන, මාලිගාවිල
B- සමාධි පිළිමය, තොළුවිල පිළිමය, පංකුලිය පිළිමය
C- ගල්විහාරය
D- දඹේගොඩ, බුදුරුවගල, කුෂ්ටරාජගල, යටාලවෙහෙර

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iii. (a) සමනල වැව, දෙහිගහ ඇළකන්ද
(b) 1. තඹකර, තඹකරු 2. තොපෂ

**4.** i. දන්තුරේ, බලන, රන්දෙනිවෙල, ගන්නෝරුව

ii. සේනා සම්මත වික්‍රමබාහු, ජයවීර බණ්ඩාර, කරලියද්දේ බංඩාර, I රාජසිංහ, යමසිංහ බණ්ඩාර

iii. බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කිරීම. මහනුවර දළදා මාළිගාව කරවීම

**5.** i. A- දොන් පිලිප් B- දෝන කතිරිනා

C- ඔස්ට්‍රියාවේ දොන් ජුවන් (දොන් ජෝන්)

ii. විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ

iii. ⋆ ග්‍රාමීය ස්වයංපෝෂිත අර්ථක්‍රමය

⋆ අන්‍යෝන්‍ය සහයෝගය, සහජීවනය හා සාමූහිකත්වයෙන් කටයුතු කිරීම.

⋆ සමාජයේ පූජ්‍ය, ප්‍රභූ, සමාන්‍ය වැසියන් ලෙස සිටීම.

⋆ පියා මූලික සමාජය ⋆ විවාහ ක්‍රම

**6.** i. ⋆ කොන්ස්තන්ති නෝපල් නගරය තුර්කිවරුන් අල්ලා ගැනීම

⋆ වෙළදාම දියුණුවීම නිසා ධනවතුන් පිරිසක් බිහිවීම ⋆ බුද්ධි ප්‍රබෝධය

ii. (a) ආගමික මුහුණුවර / ශිල්ප ශ්‍රේණි ලෙස සංවිධානය වී සිටීම
පල්ලිය පමණක් කලාවට අනුග්‍රහ දැක්වීම
ආගමික භක්තිය ජනනය කිරීම මූලික අරමුණ වීම
ස්වාධීන නිර්මාණ බිහි නොවීම
(b) ඩාන්ටේ, ශේක්ෂ්පියර්, ඉරාස්මස්

iii. A- ගුටෙන්බර්ග් B- ලියනාඩෝ ඩාවිංචි

C- කොපර් නිකස් D- ප්‍රොතෙස්තන්තවාදීන්

**7.** i. (a) සඳකඩ පහන (b) ඇත්, අස්, ගව, සිංහ

ii.

| **හරහට** | **පහලට** |
|---|---|
| 1. ඇලහැර | 1. චෝල |
| 2. පිදුරංගල | 2. රංගම්මා |
| 3. නෙළුම් පොකුණ | 3. සෙනරත් පරණවිතාන |
| 4. පුරාතන යුගය | 4. පුලස්ති |